අවසන් දිනය – 2026.03.16

**රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනවල අයදුම්කරුවන්/**
**බාහිර අයදුම්කරුවන් සඳහා**

# ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පහත සඳහන් ව්‍යාපෘතිවල දක්වා ඇති තනතුරු සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය නිලධරයන් ද ඇතුළුව සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පත්වීම් 2026.02.02 දිනැතිව මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2026හි දක්වා ඇති විධිවිධානවලට යටත් වනු ඇත.

| **ව්‍යාපෘති වටිනාකම (ඇ.ඩො. මිලියන)** | **ව්‍යාපෘතියේ නම** | **තනතුරු නාමය** | **කළ.සේ. චක්‍රලේඛ අංක 01/2026 අනුව සඳහන් වැටුප් කාණ්ඩය** | **පුරප්පාඩු ගණන** |
|---|---|---|---|---|
| ඇ.ඩො. මිලියන 25ට වැඩි සහ ඇ.ඩො. මිලියන 200ට වඩා අඩු හෝ එයට සමාන කාණ්ඩය | අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) | කළමනාකරණ සහකාර | සහායක කාර්ය මණ්ඩලය MN 2-2025 | 01 |
| | බදුල්ල වෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (BCRIP) | ගිණුම් සහකාර | සහායක කාර්ය මණ්ඩලය MN 2/ MN 4-2025 | 01 |
| | මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය (KMTTDP) | කළමනාකරණ සහකාර | සහායක කාර්ය මණ්ඩලය MN 2-2025 | 01 |
| | | ගිණුම් සහකාර | සහායක කාර්ය මණ්ඩලය MN 2/ MN 4-2025 | 01 |
| | | රියදුරු | සහායක කාර්ය මණ්ඩලය PL 3-2025 | 04 |
| | | කාර්යාල කාර්ය සහායක | සහායක කාර්ය මණ්ඩලය PL 1-2025 | 01 |
| | දෙවන අන්තර්ගතික මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය(I Road) | කාර්යාල කාර්ය සහායක (PIU-උතුර) | සහායක කාර්ය මණ්ඩලය PL 1-2025 | 01 |
| | | රියදුරු (PMU) | සහායක කාර්ය මණ්ඩලය PL 3-2025 | 01 |
| | | රියදුරු (PIU-උතුර) | | 01 |
| | | රියදුරු (PIU-නැගෙනහිර) | | 02 |
| | | රියදුරු (PIU- | | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | | බස්නාහිර) | | |
| | විවිධ විදේශාධාර ව්‍යාපෘතිය(MFAP) | යතුරු ලේඛක/ලඝු ලේඛක | සහායක කාර්ය මණ්ඩලය 2-2025 | 02 |
| ඇ.ඩො. මිලියන 200ට වැඩි හෝ එයට සමාන කාණ්ඩය | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය I (CEP I) | ප්‍රතිස්ථානගත කිරීමේ සහකාර | සහායක කාර්ය මණ්ඩලය MN 2/ MN 4-2025 | 03 |
| | | රියදුරු | සහායක කාර්ය මණ්ඩලය PL 3-2025 | 04 |
| | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය III (CEP III) | කළමනාකරණ සහකාර | සහායක කාර්ය මණ්ඩලය MN 2-2025 | 07 |
| | | රියදුරු | සහායක කාර්ය මණ්ඩලය PL 3-2025 | 12 |
| | | කාර්යාල කාර්ය සහායක | සහායක කාර්ය මණ්ඩලය PL 1-2025 | 01 |

**ඉහත සඳහන් කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2026 අනුව, ගිණුම් සහකාර MN 4-2025/ MN 2-2025 (සහායක කාර්ය මණ්ඩලය) තනතුරේ මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.**

**01. <u>ගිණුම් සහකාර (MN-4 - 2025)</u>**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිම කළ ප්‍රථම උපාධියක්

සමග

- අදාළ ක්ෂේත්‍රයේ වසර 02ක පළපුරුද්ද (සමාන තනතුරක)

**02. <u>ගිණුම් සහකාර (MN 2 – 2025)</u>**

- භාෂාව සහ ගණිතය සහ තවත් විෂයන් දෙකකට (2) වශයෙන් සම්මාන සාමර්ථ්‍ය හතරක් (4) සහිතව විෂයන් හයකින් (6) එකවරක දී අ.පො.ස (සා/පෙළ) විභාගය සමත් වීම

සහ

- අ.පො.ස (උ/පෙළ) විභාගය වාණිජ විෂය ධාරාවෙන් එකවරක දී සියලුම විෂයන්ගෙන් සමත් වීම

සමග

- අදාළ ක්ෂේත්‍රයේ වසර 02ක පළපුරුද්ද (සමාන තනතුරක)

**ඉහත සඳහන් කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2026 අනුව, ප්‍රතිස්ථානගත කිරීමේ සහකාර MN 4-2025/ MN 2-2025 (සහායක කාර්ය මණ්ඩලය) තනතුරේ මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.**

**01. <u>ප්‍රතිස්ථානගත කිරීමේ සහකාර (MN-4 - 2025)</u>**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිම කළ ප්‍රථම උපාධියක්

සමග

- අදාළ ක්ෂේත්‍රයේ වසර 02ක පළපුරුද්ද (සමාන තනතුරක)

**02. <u>ප්‍රතිස්ථානගත කිරීමේ සහකාර (MN 2 – 2025)</u>**

- භාෂාව සහ ගණිතය සහ තවත් විෂයන් දෙකකට (2) වශයෙන් සම්මාන සාමර්ථ්‍ය හතරක් (4) සහිතව සහිතව විෂයන් හයකින් (6) එකවරක දී අ.පො.ස (සා/පෙළ) විභාගය සමත් වීම

සහ

- අ.පො.ස (උ/පෙළ) විභාගය එකවරක දී සමත් වීම

සමග

- අදාළ ක්ෂේත්‍රයේ වසර 02ක පළපුරුද්ද (සමාන තනතුරක)

**ඉහත සඳහන් කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2026 අනුව, කළමනාකරණ සහකාර , යතුරු ලේඛක/ලඝු ලේඛක MN 2-2025 (සහායක කාර්ය මණ්ඩලය) තනතුරේ මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.**

- භාෂාව සහ ගණිතය සහ තවත් විෂයන් දෙකකට (2) වශයෙන් සම්මාන සාමර්ථ්‍ය හතරක් (4) සහිතව විෂයන් හයකින් (6) එකවරක දී අ.පො.ස (සා/පෙළ) විභාගය සමත් වීම

සහ

- අ.පො.ස (උ/පෙළ) විභාගය එකවරක දී සමත් වීම

**ඉහත සඳහන් කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2026 අනුව, රියදුරු PL 3 – 2025 (සහායක කාර්ය මණ්ඩලය) තනතුරේ මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.**

- භාෂාව සහ තවත් විෂයක් ද ඇතුළුව විෂයන් දෙකකට (2) සම්මාන සාමර්ථ්‍ය සහිතව විෂයන් 6කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා/පෙළ) විභාගය සමත් වීම

සමග

- සී සහ සී1 කාණ්ඩ සහිත රියදුරු බලපත්‍රය

හෝ

- බී කාණ්ඩය සහිත නව රියදුරු බලපත්‍රය

සමග

- වසර 3ක පළපුරුද්ද

**ඉහත සඳහන් කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2026 අනුව, කාර්යාල කාර්ය සහායක PL 1 - 2025 (සහායක කාර්ය මණ්ඩලය) තනතුරේ මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.**

- විෂයන් දෙකකට (2) සම්මාන සාමර්ථ්‍ය සහිතව විෂයන් හයකින් (6) දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා/පෙළ) විභාගය සමත් වීම

<u>**සාමාන්‍ය කොන්දේසි :**</u>

- බඳවා ගැනීම, වැටුප, ප්‍රතිලාභ සහ අනෙකුත් සේවා කොන්දේසි 2026.02.02 දිනැතිව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2026 හි දක්වා ඇති විධිවිධාන ප්‍රකාර වේ.
- තෝරා ගැනීම්, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ අනෙකුත් චක්‍රලේඛමය කොන්දේසි මත පදනම් වේ.
- මෙම චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතියට අනුව සියලුම අයදුම්පත් සම්පූර්ණ කර, අදාළ ලේඛනවල සියලුම පිටපත් සමග එවිය යුතු ය.
- එක් තනතුරකට වැඩි ගණනකට අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙන ම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

**01. වයස් සීමාව:**

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය නිලධරයන් සඳහා අවුරුදු 60ට අඩු
- අනෙකුත් අයවලුන් සඳහා අවුරුදු 64ට අඩු

**02. වැටුප:**

මුදල්, ක්‍රමසම්පාදන, සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2026 අනුව වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

**03. සේවා නියුක්ති කොන්දේසි:**

- පත්වීම කොන්ත්‍රාත් පදනම මත ප්‍රථමයෙන් වසරක කාලයක් සඳහා ය. සේවා අවශ්‍යතාව සහ කාර්ය සාධනය මත පදනම්ව දිගුවක් සඳහා සලකා බැලිය හැකි ය.

- අයදුම්කරු දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනයක ස්ථිර තනතුරක් දරන්නේ නම්, මෙම පත්වීම නිත්‍ය තනතුරේ පත්කිරීම් බලධරයා විසින් නිර්දේශ කරනු ලබන කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2026 හි 2.3.3 ඡේදයේ සඳහන් මුදාහැරීමේ පදනම සහ යථා පරිදි මුදාහැරීම මත පදනම් වනු ඇත.

- අයදුම්පත් නිසි පරිදි පුරවා නැති සහ දී ඇති අයදුම් පත් ආකෘතිය සමග නිවැරදි දත්ත සපයා නැති සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2026හි දක්වා ඇති අනෙකුත් අවශ්‍යතා සහ සුදුසුකම් සපුරා නැති අයදුම්කරුවන් පත්වීම් සඳහා සලකා නොබැලේ.

- පත්වීම ප්‍රදානය කිරීමේ හෝ නොකිරීමේ තීරණය සහ සේවා දිගු ලබා දීම, චක්‍රලේඛ සහ අනෙකුත් විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අභිමතය පරිදි සිදු කෙරේ.

## 04. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

පළාත් පාලන ආයතන/රාජ්‍ය සමාගම්/ව්‍යවස්ථාපිත මණ්ඩල සහ මුළුමනින් රජය සතු සමාගම් ද ඇතුළුව රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ දැනටමත් ස්ථිර තනතුරක් දරන අයදුම්කරුවෙකු තම අයදුම්පත් කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2026හි 2.3.3 ඡේදය ප්‍රකාරව නිත්‍ය තතතුරෙන් මුදා හැරීමේ සහතිකය සහ මුදාහැරීමේ පදනමේ නිර්දේශය ද සහිතව සිය ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය (එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ).

## 05. අයදුම්පත යොමු කිරීම

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහතින් දී ඇති ආකෘතිය අනුව පුරවා අධ්‍යාපන සුදුසුකම්, මූලික උපාධියේ සවිස්තරාත්මක උපාධි සහතිකය (transcript), සේවා පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු ද සහිත ව, 2026.03.16 දිනට හෝ එදිනට පෙර **ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග, හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය, "මගනැගුම මහමැදුර", අංක** 216, **ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අමාත්‍යාංශයේ පාලන අංශයට අතින් ගෙනවිත් භාර දිය හැකි ය. අයදුම්පත බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ නිවේදනයේ දැක්වෙන ආකාරයට තනතුරේ සහ ව්‍යාපෘතියේ නම සඳහන් කරන්න.

## 06. විශේෂ අවධානය සඳහා

- **දී ඇති ආකෘතියට අනුකූලව නිසි පරිදි පුරවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- **තෝරා ගැනීම සඳහා සලකා බලනුයේ අයදුම්පත සමග සහතිකවල පිටපත් ඉදිරිපත් කළ සුදුසුකම් පමණි**

**07.** **වැඩිදුර විමසීම් සඳහා - 011-2271048**

**08.** **සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවැනි අවස්ථාවක සිංහල භාෂා පාඨය බලපැවැත් වේ**.

අයදුම්පත් ආකෘතිය - ඇමුණුම 1

**ලේකම්**
**ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය**

අයදුම් කරන තනතුර

ඇමුණුම 1

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

# අයදුම් පත්‍රය

**(සහායක කාර්ය මණ්ඩල තනතුරු සඳහා)**

මහාමාර්ග අමාත්‍යාංශයේ ........................................ ව්‍යාපෘතියේ ................................................. තනතුර සඳහා අයදුම් පත්‍රය

1) අයදුම් කරන තනතුර ……………………………………………………………………..
(තනතුරු එකකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුරට වෙන වෙන ම අයදුම් පත් ඉදිරිපත් කළ යුතු ය)

2) මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්)

………………………………………………………………………………… මයා/මිය/මෙනවිය

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) Mr./ Mrs. / Miss: ……………………………………………………………………………………………

3) මුලකුරුවලින් හැඳින්වෙන නම
(සිංහලෙන්/දෙමළෙන්)
………..………………………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
……………….………………………………………………………………………

4) ජාතිය: ………………………………..

5) ස්ත්‍රී-පුරුෂ භාවය: ……………………………………

6) ජාතික හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

7) උපන් දිනය:

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

8) වයස:
(අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

9) පදිංචිය පිළිබඳ විස්තරය:

| ලිපිනය<br>…………………………………………………………....<br>………………………………………………………….<br>…………………………………………………………… | |
|---|---|
| ස්ථාවර දුරකථන අංකය | |
| ජංගම දුරකථන අංකය | |
| විද්‍යුත් ලිපිනය | |

කාර්යාලයීය විස්තර :

| ලිපිනය<br>……………………………………………………………......<br>………………………………………………………….<br>……………………………………………………………... | |
|---|---|
| ස්ථාවර දුරකථන අංකය | |
| ෆැක්ස් අංකය | |
| විද්‍යුත් ලිපිනය | |

10) අධ්‍යාපන සුදුසුකම්:

- අ.පො.ස සා/පෙළ

| අංකය | විෂය | ශ්‍රේණිය | |
|---|---|---|---|
| | | පළමු වර පෙනී සිටි අවස්ථාව විභාග අංකය: | දෙවන වර පෙනී සිටි අවස්ථාව විභාග අංකය: |
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |
| 07 | | | |
| 08 | | | |
| 09 | | | |
| 10 | | | |

- අ.පො.ස උ/පෙළ

| අංකය | විෂය | ශ්‍රේණිය | |
|---|---|---|---|
| | | පළමු වර පෙනී සිටි අවස්ථාව විභාග අංකය: | දෙවන වර පෙනී සිටි අවස්ථාව විභාග අංකය: |
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |

11) අනෙකුත් සුදුසුකම්: (උපාධි/ඩිප්ලෝමා/සහතිකපත්‍ර/පුහුණු ආදිය)

| අංකය | පාඨමාලාවේ නම | NVQ මට්ටම (ඇත්නම්) | විෂය/අදාළ ක්ෂේත්‍රය | වලංගු දිනය | විශ්වවිද්‍යාලය/ආයතනය |
|---|---|---|---|---|---|
| 01 | | | | | |
| 02 | | | | | |
| 03 | | | | | |

12) ලබාගත් පළපුරුද්ද (අනෙකුත් ආයතනවල) :

I. ස්ථිර පත්වීම් දිනය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

II. තනතුර

| |
|---|
| |

III. ස්ථිර වූ දිනය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

| තනතුර | ආයතනය | කාල සීමාව (සිට – දක්වා) | වර්ෂ ගණන |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

13) ව්‍යාපෘතිවල ලබාගත් පළපුරුද්ද

| තනතුර | ආයතනය | කාල සීමාව (සිට – දක්වා) | වර්ෂ ගණන |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

14) නිත්‍ය තනතුරෙන් පූර්ව මුදා හැරීම් ඇත්නම් ඒ පිළිබඳ විස්තර:

| ව්‍යාපෘතියේ/ආයතනයේ නම | දැරූ තනතුර | කාල සීමාව (සිට-දක්වා) | වර්ෂ ගණන | මුදා හැරීම් පදනම | | |
|---|---|---|---|---|---|---|
| | | | | පූර්ණ කාලීනව (වැටුප් සහිතව) | පූර්ණ කාලීනව (වැටුප් රහිතව) | වැඩ බලන |
| | | | | | | |
| | | | | | | |

15) පළපුරුද්ද සම්බන්ධයෙන් සහතික/ලිපි (ඡායාස්ථ පිටපත් අමුණන්න)

I. ………………………………………………
II. ………………………………………………
III. ………………………………………………

**16) අයදුම්කරුගේ සහතිකය**

මා විසින් අයදුම්පත් කැඳවීමේ නිවේදනය කියවන ලද අතර, මෙම අයදුම්පත සඳහා වන සියලුම තොරතුරු අවබෝධ කර ගත් බව සහතික කරමි. මාහට විරුද්ධව අධිකරණමය කටයුත්තක් නොමැති අතර, මවිසින් මෙම අයදුම්පතට සපයා ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට සහතික වෙමි. මවිසින් සපයා ඇති තොරතුරු අසත්‍ය බවට තහවුරු වුවහොත් මෙම තනතුරට නුසුදුස්සෙක් වන බව ද, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2026හි දක්වා ඇති කොන්දේසි සහ නියමයන් හා බැඳී සිටින බව ද දනිමි.

දිනය: ……………………………….                ……………..……………………………..

අයදුම්කරුගේ අත්සන

**17) ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**
**(පළාත් පාලන ආයතන/රාජ්‍ය සමාගම්/ව්‍යවස්ථාපිත මණ්ඩල සහ මුළුමනින් රජය සතු සමාගම් ද ඇතුළුව රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර කර ඇති නිලධරයන්)**

01. මෙම අයදුම් පත ඉදිරිපත් කරනු ලබන ..............................................................(වත්මන් සේවා ස්ථානය) සේවයේ නියුතු ..................................................මහතා/මහත්මිය/මෙනවිය(අයදුම්කරුගේ නම)ගේ පෞද්ගලික ලිපිගොනුවේ විස්තර අනුව පහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

| | |
|---|---|
| • පෞද්ගලික ලිපිගොනුවේ අංකය | |
| • ස්ථිර තනතුර | |
| • මුල් පත්වීම් දිනය | |
| • ස්ථිර කළ දිනය | |

02. මෙම අයදුම්කරු ...................................................................... (වත්මන් සේවා ස්ථානය)..........................................................................(අයදුම්කරුගේ නිත්‍ය තනතුර) වශයෙන් සේවය කරන අතර, ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති අතර, විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් කර හෝ නොමැත.

03.

| ව්‍යාපෘතියේ/ආයතනයේ නම | දැරූ තනතුර | කාලය සිට-දක්වා | වර්ෂ ගණන | මුදාහැරීමේ පදනම | | |
|---|---|---|---|---|---|---|
| | | | | පූර්ණ කාලීනව (වැටුප් සහිත) | පූර්ණ කාලීනව (වැටුප් රහිත) | වැඩ බලන |
| | | | | | | |
| | | | | | | |

එමෙන් ම, ඔහුගේ/ඇයගේ නිත්‍ය තනතුරෙන් කලින් සිදු කළ මුදාහැරීම් පිළිබඳ විස්තර ඔහුගේ/ඇයගේ පුද්ගලික ලිපිගොනුව අනුව ඉහත වගුවේ දක්වා ඇති අතර, එම තොරතුරු තහවුරු කරමි.

04. ඉහත තොරතුරු සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2026 විධිවිධාන සලකා බලා, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ නිත්‍ය තනතුරෙන් මුදා හැරිය හැකි බව ද, ..................................................(තවදුරටත් මුදාහරින කාලය) සඳහා එකී චක්‍රලේඛයේ සඳහන් 2.3.3. අ - වැටුප් සහිත පූර්ණ කාලීන පදනමින් මුදා හැරීම / 2.3.3 ආ - වැටුප් රහිත පූර්ණ කාලීන පදනමින් මුදා හැරීම / 2.3.3 ඇ - වැඩ බලන පදනමින් මුදා හැරීම ප්‍රකාරව මුදා හැරිය හැකි බව සහ මුදා හැරීමට එකඟවන බව ද ප්‍රකාශ කරමි.

දිනය: ………………………………… ……………………………………………………….

ආයතන ප්‍රධානියාගේ අත්සන සහ මුද්‍රාව